**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ මිළදී ගෙන තිබුණු යන්ත්‍ර උපකරණ සහ ලීබඩුවල වටිනාකම රු.56,788 ක් වුවත්, එය ඉකුත් වර්ෂයේ රු.697,208 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.640,420 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියෝ සඳහා රු.4,639,621 ක වෙන්කිරීම වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වගකීම් හා වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ ඉකුත් වර්ෂයට අදාළ විශ්‍රාම වැටුප් දායක මුදල් රු.809,026 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමෙන් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් සඳහා වන රු.80,400 ක පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.ඊට අමතරව ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලි රු.48,400 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් රු.880,000 ක් වුවත්,එය රු.808,000 ක් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් වත්කම් රු.72,000 ක් අඩුවෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිළදී ගැනීම් සහ පොත් පරිත්‍යාග වටිනාකම රු.134,712 ක් පුස්තකාල පොත් ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.446,151 ක් වුවත්, එය රු.262,497 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු.183,654 කින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ඉකුත් වර්ෂයන් සඳහා මුද්දර ගාස්තු වෙන්කිරීම් වලට අදාලව රු.744,876 ක් සමුච්චිත අරමුදලට බැර කළ යුතු වුවද, රු.262,498 ක් බැර කිරිම හේතුවෙන් රු.482,378 ක් සමුච්චිත අරමුදල අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 08 ක පොදු ලෙජර් ගිණුම් අනුව ශේෂය සහ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ ශේෂය අතර රු.5,795,454 ක වෙනසක් නිරික්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.19,196,168 ක වූ ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 5 ක් හිඟහිටි වෙනත් ආදායම් රු.18,599,325 ක් , වර්ෂ 4 ක්වූ අත්තිකාරම් රු.589,093 ක්, හා වර්ෂ 4 ක්වූ ප්‍රතිපූර්ණය විය යුතු මන්ත්‍රී දීමනා රු.7,750 ක් ඇතුළත් විය.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ එකක් වූ ගෙවිය යුතු විවිධ ණයහිමියෝ රු.5,601,753 ක් ඇතුළත් විය.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 157,382,974 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

1.3.5.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | (i) | 147(1)වගන්තිය හා 2016 දෙසැම්බර් 16 දිනැති අංක 1988 දරන ගැසට් පත්‍රය | -- | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපාර ස්ථාන 483 කින් වෙළද බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. |
| | (ii) | 158 ,159(1) වගන්ති | 2,083,735 | සමාලෝචිත වර්ෂයට අදාළ සියලු ආදායම් අය කර සහා අරමුදලට බැර කර නොතිබුණි. |
| (ආ) | | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ හා 1986 මාර්තු 10 දින අංක 392/9 ගැසට් පත්‍රයේ නියෝග 67 | | 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුම් 44 කින් 33 ක් වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. |
| (ඇ) | | 1988 ප්‍රාදේශීය සභා( මුල්‍ය හා පරිපාලන) | | |
| | (i) | රීති 214 | | සභාවේ ඇති ගබඩා ද්‍රව්‍ය පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි. |
| | (ii) | රීති 218 | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරික්ෂා කර සභාවට වාර්තා කර නොතිබුණි. |
| (ඈ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xviv පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 61,414 | සභාවේ සේවය කර සේවයෙන් ඉවත්ව ගිය හා විශ්‍රාම ගිය සේවකයින් 4 දෙනෙකුගෙන් අයවිය යුතු ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 103 (1) | | සභාවට අයත් යන්ත්‍රයකට සිදුවී තිබුණු අනතුරක් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 110 | | හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371 | 494,051 | 2014 හා 2015 වර්ෂ වල අවස්ථා 5 කදී ග්‍රාම සංවර්ධන සමිති දෙකක් වෙත ලබා දී තිබුණු අත්තිකාරම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,106,235 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,537,025 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 1,149,040 | 1,149,040 | 996,023 | 153,017 | 1,047,000 | 1,047,000 | 864,880 | 182,119 |
| (ii) කුලී | 2,627,263 | 2,627,263 | 1,752,916 | 874,346 | 3,191,100 | 3,491,100 | 1,671,907 | 1,819,192 |
| (iii)බලපත්‍ර ගාස්තු | 506,500 | 506,500 | 469,491 | 37,009 | 950,500 | 950,500 | 546,580 | 403,920 |
| (iv)වෙනත් ආදායම | 146,655 | 146,655 | 146,655 | -- | 387,219 | 387,219 | 60,576 | 326,643 |
| එකතුව | 4,429,458 | 4,429,458 | 3,365,085 | 1,064,372 | 5,575,819 | 5,875,819 | 3,143,943 | 2,731,874 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 4.4 ක් වූ අතර,වර්ෂය තුළදී රැස්කළ ආදායම රුපියල් මිලියන 3.4 ක් විය. කෙසේ නමුත්,වර්ෂය අවසාන වනවිටත් රුපියල් මිලියන 1 ක හිඟ ආදායමක් තිබුණු අතර,ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 61 දක්වා අඩු වී තිබුණි.

2.2.3 **කුලී**

(අ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂ 5කට වරක් බදු කුලිය තක්සේරු කළ යුතු වුවත්, 2011 වර්ෂයේ තක්සේරුව මත කුලී අයකරමින් තිබුණි.

(ආ) 2015 දී කඩ කුලී තක්සේරුව සංශෝධනය කර තිබුණද, එම තක්සේරුව මත කුලී අය කිරීමෙන් තොරව 2011 වර්ෂයේ තක්සේරුව මත ගාස්තු අයකිරිම හේතුවෙන් වර්ෂයකට රු.8,433,660 ක ආදායම් අහිමි වී තිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,400,000 ක් හා මුද්දර ගාස්තු රු.446,151 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

1987 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට කාරණා 29 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කර නොතිබුණු අතර, 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 1534/18 හා 2008

පෙබරවාරි 01 දිනැති ගැසට් පත්‍රයේ නියෝග වලට පටහැනිව රැස්කරනු ලබන කසළ 10 කණුව ප්‍රදේශයේ විවෘත කඳු සහිත භූමියකට බැහැර කරමින් තිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

-------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 මැයි 23 දින වන විටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 130 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 29 අනුව ලැබෙන මුදල් දිනපතා බැංකු ගතකළ යුතු වුවත්, ආදායම් පරීක්ෂක විසින් 2017 පෙබරවාරි 01 දින ක්ෂේත්‍ර යේදී එකතු කළ කඩ කුලී රු.119,690 ක් බැංකු ගත කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 06 ක් හා අතිරික්ත 08 ක් පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

සභාව සතු ට්‍රැක්ටරයක්, ඩොලමයිට් ව්‍යාපෘතියෙහි ගොඩනැගිල්ල හා ඩබල් කැබ් රථයක් වර්ෂ 05 සිට වර්ෂ 10 ක කාලයක් නිශ්ක්‍රීය වත්කම් ලෙස පැවතිණි.

**3.5 ප්‍රසම්පාදනය**

--------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| | ---------- | | ----------- |
| (අ) | ගිණුම්කරණය | (i) | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් නොකිරිම. |
| | | (ii) | ගිණුම් ශේෂ සඳහා අදාල උපලේඛන ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරිම හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන හා යන්ත්‍රෝපකරණ ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් නොකිරීම. |
| | | (ii) | සමහර ස්ථාවර වත්කම් නිෂ්ක්‍රියව පැවතීම. |
| | | (iii) | වාහන ධාවන සටහන් පවත්වා නොතිබීම. |
| (ඇ) | ගබඩා පාලනය | (i) | විධිමත්ව භාණ්ඩ ගබඩාකර නොතිබීම. |
| | | (ii) | භාණ්ඩ නිකුත් කිරීමේදී නිකුත් කිරීම් නියෝග භාවිතා කර නොතිබීම. |
| (ඈ) | ණය පාලනය | (i) | ණයගැති හා ණයහිමි ශේෂ සනාථ කර නොතිබීම. |
| | | (ii) | ලේඛන නඩත්තු නොකිරිම. |
| | | (iii) | ණයගැති පාලන ගිණුම් නඩත්තු නොකිරිම. |
| (ඉ) | කොන්ත්‍රාත් පාලනය | (i) | ඉදිකිරීම් ආරම්භ නොකරන ලද ව්‍යාපෘති සඳහා ලබාදුන් අත්තිකාරම් අයකර නොගැනීම. |
| | | (ii) | අත්හරින ලද ව්‍යාපෘති සඳහා ගෙවා තිබුණු අත්තිකාරම් නිරවුල් නොකිරීම. |